# සනත් ජයසූරිය ටෙස්ට් ක්‍රීඩාවෙන් නික්ම යයි



**ක්‍රි**කට් කවදත් ඉහළ පෙළැන් තියේ ක්‍රීඩාවක් ලෙස සටහන් වෙයි. අදත් එය පාපන්දු මෙන් පොදු ජනයාගේ ක්‍රීඩාවක් ලෙස නොසැලකේ. එනිසාම එය ආරම්භයේ ශ්‍රීලංකාවේ ඉහළ පාසැල් උරුම කරගත් සෙල්ලමක් විය. පසු කාලයක එය ගම දක්වා විහිද ගියත් ලංකාවේ ජාතික ක්‍රිකට් කණ්ඩායම තෝරන විට හැමවිටම එකල තේරුණේ කොළඹ සුපිරි පාසැල්වල සිසුන් පමණි. එසේ වුවද එම සීමා පවුරු බිඳ දමමින් ශ්‍රීලංකා පිළට ගමෙන් එනම්, මාතරින් එකතු වූ ක්‍රීඩකයෙකි සනත් ජයසූරිය.

සනත්ගේ වේගවත් පිති ප්‍රහාරය හමුවේ ලෝකයේ නම් දැරු බොහෝ පන්දු යවන්නෝ අසරණ වූහ. එම වේගවත් ප්‍රහාරය නිසාම ඔහු හඳුන්වනු ලැබුවේ **මාස්ටර් බ්ලාස්ටර්** යනුවෙනි. පිතිකරුවෙකු වශයෙන් ශ්‍රීලංකා කණ්ඩායමට එක්වූ සනත් පසුව වමතින් දඟ පන්දු යවමින් දස්කම් දක්වා පන්දු රැකීමද ඇතුළුව තුන් ඉරියව්වේම කැපී පෙනෙන, එසේම ශ්‍රීලංකා පිළට නැතුවම බැරි ක්‍රීඩකයෙකු විය. ශ්‍රීලංකාව ප්‍රථම වරට ලෝක ක්‍රිකට් ශූරතාව දිනූ වකවානුවේ ඒ තරඟ මාලාවේ නොමැකෙන සටහන් තැබූ සනත් ගැන මුළු මහත් ලෝකයාම කතා කරන්ට වූ හැටි අපට මතකය. ඔහු ගැන වාර්තා පිට වාර්තා ලොව පුරා පුවත්පත් වල පළවිය. ශ්‍රීලංකාවේත් ශ්‍රීලාංකිකයින් වෙසෙන හැම රටකමත් කාගෙත් එකල කතා බහ වූයේ සනත් ජයසූරිය ගැනය. ඔහුගේ පුදුම පිති හරඹය ගැනය.

අර්ජුණ රණතුංග ඉවත් වීමෙන් පසු ශ්‍රීලංකා පිළේ නායකයා බවට පත් සනත් 2003 වසරේ ලෝක කුසලාන තරඟා වලියෙන් පසු නායකත්වයෙන් අස්වී ක්‍රීඩකයෙකු ලෙසින් පමණක් තරඟවලට සහභාගි වූයේය.

2006 වසරේ අප්‍රේල් මාසයේ ශ්‍රීලංකාවේ දී පකිස්ථානයට එරෙහිව ඉතා දුර්වල ලෙස ක්‍රීඩා කළ නිසා පීඩනයට පත්ව සිටි සනත් ටෙස්ට් ක්‍රිකට් වලට සහභාගි වීමෙන් වැළකී සිටියේය. එසේ වුවද අවුරුදු **1½** කට පසු ලංකා ක්‍රිකට් තේරීම් කමිටුවේ සභාපති අසන්ත ද මෙල්ගේ ආරාධනයෙන් සනත් නැවතත් ටෙස්ට් තරඟ වලට අවතීර්ණ වීය.

එනමුත් ටෙස්ට් පිටියේ ඔහුට සුපුරුදු දස්කම් පෙන්වීමට නොහැකි වූ නිසාවෙන් පසුගිය 5 වන බදාදා අස්ගිරියේදී නිමාවට පත්වූ ශ්‍රීලංකා එංගලන්ත ටෙස්ට් තරඟයට ක්‍රීඩා කිරීමෙන් පසුව ඔහු නැවතත් ටෙස්ට් තරඟ වලින් සමුගත්තේය.

1991 දී නවසීලන්ත පිළට එරෙහිව ක්‍රීඩා කරමින් ක්‍රිකට් දිවිය ඇරඹූ සනත් මේ වන විට ටෙස්ට් තරඟ 110 කට සහභාගි වී ලකුණු 6973 ක් රැස්කර ඇත. ටෙස්ට් 109 කදී කඩුළු 97 ක් බිඳ දමා ඇත. රැස් කල සාමාන්‍යය ලකුණු 40.07කි.

ඔහු ටෙස්ට් ශතක 14 ක්ද අර්ධ ශතක 31 ක්ද ලබා ඇත. එක ඉනිමකදී ලබාගත් වැඩිම ලකුණු සංඛ්‍යාව ඔහු ඉන්දියාවට එරෙහිව රැස්කළ 340 යි.

ජයසූරිය 1997 වසරේ හොඳම විස්ඩන් ක්‍රීඩකයා වීය

ශ්‍රීලංකාවේ මිතුරෙකු නොවන නමුත්, වේගපන්දු යැවූ ඕස්ට්‍රේලියානු ක්‍රීඩක ග්ලෙන් මැග්රාත් වරක් මෙසේ කීය.

" 1996 වර්ල්ඩ් කප් තරඟ මාලාවේදි ආරම්භක පිතිකරුවෙකු ලෙස සනත් ඉන් පෙර කිසි කලෙක නුවූ වේගයකින් ලකුණු රැස්කළා. එදා තමයි එක්දින ක්‍රිකට් ක්‍රීඩාව ගැන කාගෙත් සිතුවිලි වෙනස්වුනේ. ක්‍රීඩකයෙකුට හැකිනම් ක්‍රීඩාවක් වෙනස් කරන්න අලුත් මුහුණුවරක් දෙන්න අනිවාර්යයෙන්ම ඔහු ඉමහත් ගෞරවයක් ලැබිය යුතු කෙනෙක් "

ටෙස්ට් තරඟවලින් සමුගත්තද තමා එක් දින ක්‍රීඩාවේ නිරත වන බව ඔහු පවසයි. ක්‍රිකට් ක්‍රීඩාවට ජවය හා සුන්දරත්වය එකතු කළ සනත් ජයසූරිය නම් අග්‍රගණ්‍ය ක්‍රීඩකයාගේ පිතිප්‍රහාර දැක්මට තරම් අපි භාග්‍යවන්තයෝ වීමු. සනත් ජයසූරිය අප රටට ද, ලොව පුරා ලක්ෂ සංඛ්‍යාත ක්‍රිකට් ලෝලී ජනතාව ටද කෙසේ නම් අමතක වේද? අමතක කළ හැකිද?

**සුජීව නිවුන්හැල්ල**

## මේ කපේදී කිසිවෙකුට කඩන්නට බැරි

# මුරලිගේ ලෝක වාර්තාව




**THE SPECIAL ONE: Murali holds aloft the ball that fetched him the record at the Asgiriya Stadium in Kandy**

## Murali's possible permanent record

**By Stephen Brenkley**


What, it may be asked as the years pass, have Mluleki Nkala, Martin van Jaarsveld and Paul Collingwood in common as Test cricketers ? Put another way, did you hear the one about the Zimbabwean, the South African and the Englishman?

The answer is that each of them was the victim of Muttiah Muralitharan as he broke the world record for the number of Test wickets taken by one bowler. Nkala was the first when Muralitharan caught and bowled him at Harare in May 2004 to go past the figure of 519 wickets, which had been set by the West Indian fast bowler, Courtney Walsh.

Van Jaarsveld was the second at Galle that August after Shane Warne had levelled affairs at 527 wickets each. Warne was to take the record outright in October of the same year at Chennai, moving the total to 532. He stayed ahead until yesterday at Kandy when Collingwood became the third batsmen to allow Murali to hold the record alone.

It will stand for years and years. Warne is retired, the man in third place on the list on 573 wickets, Anil Kumble is, at 37, two years older than Murali. The nearest of the other bowlers still playing is Muralitharan's compatriot, Chaminda Vaas on 322.

After the scenes of celebration yesterday it was being suggested that someone like Monty Panesar, the English left-arm spinner might have a chance. Panesar is 25 and has 76 wickets. By that time Murali has some 60 more. The legendary Sydney Barnes of England held the record with 189 wickets for 23 years between 1913 and 1936. Murali's eventual figure, whatever it is, may last as long.




# නවතම නත්තල් ගී තැටිය

**කිතු බැති ගී** මේ නොබෝදා පිටවූ නවතම නත්තල් ගී තැටියයි. ලන්ඩනයේ වෙසෙන ප්‍රවීන සංගීතඥ නිමල් මෙන්ඩිස් ගී පද ලියා, තනුව හා සංගීතය මුසු කළ, **Cold Cold Night** නම් ඉංග්‍රීසි ගීයේ සිංහල අනුවාදය **සීත සිසිල් රෑ** යනුවෙන් ගායනා කර ඇත්තේ ඕස්ට්‍රේලියාවේ පර්ත් නගරයේ වෙසෙන තරුණ සංගීතවේදියෙකු හා ගායකයෙකු වන නලීන් ජයවර්ධනයි. සීත සිසිල් රෑ ගී පද ලියුවේ ඇමරිකාවේ වෙසෙන ආචාර්ය විකුම් පෙරේරා ය.

ලොවපුරා ශ්‍රීලාංකිකයින් අතර ජනප්‍රිය **Sinhala Juke Box** නම් සිංහල ගීත වෙබ් අඩවිය නිර්මාණය කළේ නලීන් ජයවර්ධන සහ ඔහු සොයුරු රොහාන් දෙදෙනායි.

# මෝඩ පොලිස් නිලධාරියා නිසා ජීවිත 19 ක් මරුට

**ඔහු කතුරක් ගෙන්වා බෝම්බ පාර්සලය කැපුවේය. එපමණකි. වලක්වාගත හැකිව තිබුණු නුගේගොඩ බේදවාචකය එසේය**



## අවමංගල්‍ය Obituary

# නානායක්කාර ගුණවර්ධන මහතා
# Mr Nanayakkara Gunawardena



ලන්ඩනයේ Harlsden හි විසූ
**එන්. ගුණවර්ධන මහතා**
අභාවප්‍රාප්ත විය. අවසන් කටයුතු
**2007** දෙසැම්බර් **13** වෙනි
දින දහවල් **2. 45** ට
ලන්ඩනයේ ගෝල්ඩර්ස් ග්‍රීන්හි
ආදාහනාගාරයේදී සිදුකෙරේ. සියළු
නෑ හිතමිත්‍රාදීහු මෙම නිවේදනය
කරුණාවෙන් පිළිගනිත්වා !

**ගුණවර්ධන මහත්මාට**
**නිවන් සුව අත්වේවායි පතමු!**

ශෝකයට පත් පවුලේ සියළු දෙනා

නිවස-
12 Brownlow Road
London NW10 9QL
**0208 961 6307**